**7. ගාථාව**

**න පරේසං විලෝමානි - න පරේසං කතාකතං,**
**අත්තනෝව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **පරේසං** | - | අනුන්ගේ |
| **විලෝමානි** | - | පරුෂ වචනයෝ |
| **න** | - | නො මෙනෙහි කළ යුතු ය. |
| **පරේසං** | - | අනුන් |
| **කතාකතං** | - | කළ නො කළ දේ ද |
| **න** | - | නො බැලිය යුතු ය. |
| **අත්තනෝ ඒව** | - | තමාගේ ම |
| **කතානි** | - | කළ දේ ද |
| **අකතානි ච** | - | නො කළ දේ ද |
| **අවෙක්ඛෙය්‍ය** | - | විමසා බැලිය යුතු ය. |

**භාවාර්ථය**

අනුන්ගේ රළු-පරළු කථාත්, අනුන් කළ නො කළ දෙයත් නො සෙවිය යුතු ය. තමා කළ නො කළ දෙය ම පිරික්සා බැලිය යුතු ය.

**නිදන කථාව**

සැවැත් නුවර ගෘහපතිනියක් පාඨික නම් ආජීවකයකු පුත් තනතුරේ තබා වඩයි. අසල්වැසි මනුෂ්‍යයෝ විහාරයට ගොස් බුදු රජුන්ගෙන් ධර්මය අසා අවුත් ඇය ඉදිරියෙහි "බුදුරජුන්ගේ බණ කීම ඉතා පුදුමැ'යි" නොයෙක් අයුරින් බුදුගුණ කියන්නට වූහ.

ඇය ඒ අසා පුදුමයට පැමිණ විහාරයට ගොස් බණ අසනු කැමති ව ආජීවකයාට ඒ බව කීවා ය. හෙතෙමේ "නො යව" යි ගමන වැළැක්වී ය. එහෙත් ඕ තොමෝ නැවත නැවතත් යා යුතු බව දැන්වූවා ය. ආජීවකයා ඒ හැම වර ම ඇගේ ගමනට බාධා කළේ ය. විහාරයට ගොස් බණ අසන්නට මොහු ඉඩ නො දෙන බැවින් "බුදුරජාණන් වහන්සේ නිවසට වැඩමවාගෙන දහම් අසන්නෙමි" යි සිතා තම පුතු අමතා "පුත! විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට හෙට මෙහි වඩින්නට ආරාධනා කොට එන්නැ" යි ඔහු පිටත් කළා ය.

විහාරයට යන ගමනෙහි දී හේ පළමු ව ආජීවකයා ළඟට ගොස් වැඳ පසෙක හුන්නේ ය. ආජීවකයා "විහාරයට යන්නේ කුමන කාරණයකට ද"යි අසා ඒ ගමන බාධා කිරීමට ගත් උත්සාහය අසාර්ථක ව ඔහුට මෙසේ උපදෙස් දුන්නේ ය.

"තොප සිටින ගෙය අසවල් තැන ය, අසවල් මාර්ගයෙන් යා යුතු ය, යනාදි කිසිවක් නො කියා ආරාධනා කොට එව" යි කීය. ඔහු ද එසේ කොට ආපසු ආජීවකයා වෙත ගියේ ය. "කෙසේ ද? මා කී සැටියට කළේ ද" යි ඇසූ කල්හි "එසේ කළෙමි" යි පිළිතුරු දුන්නේ ය. "එසේ නම් බුදුරජුන්ට දෙන දෙය අප දෙදෙනාට කෑ හැකි ය." යි කියා පසුදා උදෑසන ම ඔහු එම නිවසට ගොස් පිටුපස ඕවරකයකට (කාමරයකට) වී සිටියේ ය. නිවසට වැඩම කිරීමට මග කියන්නෙකුගෙන් බුදුරජුන්ට වැඩෙක් නැත. බෝමැඩ වැඩහිඳ බුද්ධඥානය ලත් වේලෙහි 'මේ සතර අපායට යන මග ය, මේ මිනිස්ලොවට යන මග ය, මේ දෙව්ලොව මග ය, මේ මග නිවන් පුරයටැ' යි බුදුරජාණන් වහන්සේට සියලු මග එළිපෙහෙළි විය. ගම්-නියම්ගම් යන මං ගැන කිය යුත්තෙක් ම නැත.

බුදුරජාණන් වහන්සේ ආරාධනා පරිදි එහි වැඩි සේක. උපාසිකා තොමෝ ද බුදුරජාණන් වහන්සේ දැක වහා ගෙයින් පිටතට ගොස් පසඟ පිහිටුවා වැඳ නිවස තුළට වැඩම කරවා ඉතා රසැති ආහාර පානයෙන් බුදුරදුන් වැළඳෙව්වාය. දන් වළඳා අවසානයෙහි බුදුරජාණන් වහන්සේ ඉතා මිහිරි හඬින් දහම් දෙසූ සේක. උපාසිකා තොමෝ සාධුකාර දි දී දහම් ඇසුවා ය.

ආජීවකයා එය අසා ඉවසාගත නො හැකි ව උපාසිකාවටත් බුදුරජාණන් වහන්සේටත් බණිමින් පලා ගියේ ය. උපාසිකාව ඒ අසා ලැජ්ජාවට පත් ව දහමට සිත යොමු කරන්නට අසමත් වූවා ය. එවිට බුදුරජාණන් වහන්සේ "උපාසිකාව**!** දහමට සිත යොමු කරන්නට අපොහොසත් ද"යි අසා වදාළ සේක. "ස්වාමීනි**!** මොහුගේ කථාවෙන් මා සිත අන් අතකට පෙරළිනැ" යි කීවා ය. "විසභාග මනුෂ්‍යයන්ගේ කථාවනට කන් දීම නුසුදුසු ය. මෙබඳු දේට කන් නො දී ඒ ගැන නො සිතා නො විමසා තමන් කළ නො කළ දේ ගැන සිතා බැලීම කළ යුතු" යි යනුවෙන් වදාළ බුදුරජාණන් වහන්සේ **"න පරෙසං විලොමානි"** යන ගාථාව වදාළ සේක.

ධර්මදේශනාවගේ අවසානයෙහි උපාසිකා තොමෝ සෝවාන් ඵලයෙහි පිහිටියා ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - චාරිත්‍ර නැසීම රැකීම ඔබ සතු ය.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(නිකිණි 2552)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**